සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

# 2023

නැණ ලොවට පා නගන හපනුන්ට මග කියන

# "අදිති"

**1**

## II පත්‍රය

පැය 01 ය මිනිත්තු 15

විභාග අංකය ...............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 62 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

- **පහත දී ඇති ඡේදය හොඳින් කියවන්න.**

'' තිත් මුවෝ කීප දෙනෙක් ඉදිරියට ආහ. ඔවුන් ගමන් ගත්තේ යාන්තමින් පොළොවට පා තබන්නාක් මෙන් ඉතා නිසල ව ය. අං තට්ටු කීපයක් දැරූ ලොකු මුවෙක් වැව ඉවුරේ සිට ගෙන දෙකන් ඒ මේ අත හරවමින් උදාර ලීලාවෙන් බලා සිටියේ ය. ඌ රලේ නායකයා වන්නට ඇත. ඌ එසේ සිටිද්දී සෙස්සෝ වැවට බැස දිය බොන්නට වූහ. මුව දෙනක් කුඩා පැටවකුත් සමඟ දියට බැස්සා ය. අනතුරු ව, මෙතෙක් වේලා ගොඩ සිටි මුවා ද වැවට බැස්සේ ය. ''

( වනගත ළමෝ )

❖ ඡේදය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. ඡේදයෙන් විස්තර වන පරිදි සතුන් සිටින ස්ථානය කුමක් ද?.........................................

ii. උදාර ලීලාවෙන් බලා සිටියේ කවු ද? ...................................................................

iii. මෙහි ඇති ස්ත්‍රී ලිංග ඒකවචන නාම පදය කුමක් ද? .....................................................

iv. ' වෙනත් අය ' යන්නට සමානාර්ථ පදයක් ලියන්න. .......................................................

v. බහුවචන අතීතකාල ක්‍රියා පදයක් තෝරා ලියන්න. .......................................................

(ලකුණු 05)

02. පහත දී ඇති පදවලට බහුවචන පද ලියන්න

i. මුවා = ..............................................

ii. අං තට්ටුව = .................................................. (ලකුණු 02)

03. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. දේශගුනය/ දේශගුණය/ දේසගුනය

ii. දූශනයය / දූෂනය / දූෂණය

(ලකුණු 02)

04. පහත සඳහන් වගන්ති හරි නම් ( √ ) ලකුණ ද, වැරදි නම් ( × ) ලකුණ ද, වරහන් තුළ යොදන්න.

i. '' පිරුණු '' යන්න නාම විශේෂණ පදයකි. ( )

ii. '' ගියහ '' යන්න ප්‍රාණවාචී අතීත කාල ක්‍රියා පදයකි. ( )

(ලකුණු 02)

05. ඉරි ඇඳි අකුරට යෙදී ඇති පිල්ලම ලියන්න.

i. **<u>වෛ</u>**වර්ණ - ......................................................................................................

ii. **<u>කෞ</u>**මදී - ..............................................................................................................

(ලකුණු 02)

06. සුදුසු පරිදි විරාම ලකුණු යොදන්න.

මට මොකද වූණේ මම අලුත් වෙලා

(ලකුණු 02)

07. පහත වැකි ලිඛිත බසට හරවන්න.

i. මම මුහුණ සෝදනවා - ..........................................................................................

ii. ඇය පාසලට එනවා - ............................................................................................

(ලකුණු 02)

08. ඉරි ඇඳි පදයේ ස්ත්‍රීලිංග පදය ලියන්න.

i. මගේ **<u>මිතුරා</u>** දක්ෂයි. - ...............................................................................

ii. **<u>සිංහයා</u>** පාඩුවේ ඉන්නවා - ...........................................................................

(ලකුණු 02)

09. පහත ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

ඉඳිකටුවයි..................................................... වගේ

(ලකුණු 01)

10. සුදුසු ක්‍රියාපදය තෝරා යටින් ඉරක් අඳින්න.

i. මම සනීපයෙන් ....................................................... (සිටිමු / සිටිමි)

ii.. ගුරුතුමිය අකුරු කියා .................................................. ( දුන්නේ ය/ දුන්නා ය)

(ලකුණු 02)

11. එක් එක් ඉංග්‍රීසි වචනයේ අර්ථය සිංහලෙන් ලියන්න.

i. Well - ................................... ii. Train - ...........................................

(ලකුණු 02)

12. එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.



| M | | | | o |
|---|---|---|---|---|



| P | | | | o | |
|---|---|---|---|---|---|

(ලකුණු 02)

13. පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i. I / bananas / like - .............................................................................

ii. a / I / beak / have - ........................................................... (ලකුණු 02)

14. ''ආසිරියර්'' යන දෙමළ වචනයේ අර්ථය සිංහලෙන් ලියන්න. .......................................

(ලකුණු 01)

15. මෙම වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහල අකුරෙන් ලියන්න.

මම රාණි, ඔබ කවුද ? ..................................................................................................

(ලකුණු 01)

❖ **පහත ගැටලු විසඳන්න.**

16. **6073** සංඛ්‍යාවේ එක් එක් ඉලක්කම පිහිටි ස්ථානය හඳුනාගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| දහස්ථානය | සියස්ථානය | දහයස්ථානය | එකස්ථානය |
|---|---|---|---|
| | | | |

17. රවුම තුළ ඇති ඉලක්කම් සියල්ලම භාවිත කර සෑදිය හැකි විශාල ම සංඛ්‍යාව කුමක්ද ?

3 1
7 8

..........................................................................

18. පහත සංඛ්‍යා තුන කුඩා ම සංඛ්‍යාවේ සිට විශාල ම සංඛ්‍යාව තෙක් පටිපාටිගත කරන්න.

645, 463, 546 = ..........................................................................................

19. යහළුවන් දෙදෙනෙක් ළඟ තිබූ පොත් ප්‍රමාණය පිළිවෙළින් 1238 ක් හා 2129 ක් වේ. දෙදෙනා ළඟ ඇති මුළු පොත් ප්‍රමාණය කොපමණද ? ..................................................

20. එකතුව ලෙස 763 ලැබෙන්නේ පහත සඳහන් කුමන සංඛ්‍යා දෙක එකතු කළ විට ද?

| | | |
|---|---|---|
| 458 | 562 | |
| | 305 | 175 |

..............................................................................................

21. ගුරු මේසයේ දිග මීටර 1 සෙන්ටිමීටර 25 කි. එය සම්මත සංකේත යොදා ලියන්න.

..............................................................................................................................

22. විසඳන්න.

87 —(- 20)→ [.................] —(- 43)→ [............]

23. පෙට්ටියක සබන් කැට 187 ක් ඇසිරිය හැකි ය. එහි දැනට ඇත්තේ සබන් කැට 93 කි. තව සබන් කැට කීයක් එයට දැමිය හැකිද ? ...................................................................

( ලකුණු 2 x 8 )


24. පහත සංඛ්‍යා රටාවේ ඊළඟට ආ යුතු සංඛ්‍යාව ලියන්න.

22, 25, 28, 31 ..................................................

25. එක් අයෙකුට ටොෆි දෙක බැගින් ළමයින් 34 දෙනෙකුට දීමට අවශ්‍ය ටොෆි ගණන කීයද? ...............................................................

26. පැන්සල් 26 කින් බාගයට පැන්සල් කීයද ? ...............................................................

27. පහත ඝනවස්තුවේ ඇති දාර ගණන හා මුහුණත් ගණනේ එකතුව කීය ද?




..........................................................................

28. එකක් රුපියල් 5 යි සත 50 ක් වන මකන තුනක් මිල දී ගත් අයෙක ගෙවිය යුතු මුදල කීය ද? රුපියල් ...................... සත .........................

29. 2kg 750g ක ග්‍රෑම් 250 ඒවා කොපමණද ? ...............................................................

30. ඔබ නැගෙනහිර දිශාවට මුහුණලා සිටගෙන සිටිනා විට ඔබේ දකුණු අත තිබෙන්නේ කවර දිශාවකට ද ?...........................................................................................................

31. පහත ප්‍රස්තාරය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




i. ඇන්තූරියම්වලට කැමති සිසුන් ගණන 5 කි. එය ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

ii. නෙළුම් මල්වලට වඩා අරලිය මල්වලට කැමති සිසුන් ගණන කීයද ?

........................................

( ලකුණු 2 x 8 )

❖ ප්‍රශ්න අංක 32 සිට 61 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

32.මගේ සිත නිවීමෙන් ලැබෙන සැනසිල්ල මට දැනේවා! යනුවෙන් සිතිවිලි ඇති කරන්නේ සිත් පහන් කිරිමේ ක්‍රියාකාරකමේ

(1) ශාරිරික ලිහිල් බවේ දී (2) ප්‍රාර්ථනාවේ දී (3) අධිෂ්ඨානයේ දී

33. සිසුන් තුළ තිබිය යුතු ගුණාංගයන් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ක්‍රමවත් බව, ඉවසීම, කලබල වීම (2) ආත්මාර්ථකාමී බව, පිළවෙළ, ඉවසීම

(3) ක්‍රමවත් බව, ඉවසීම, උපදෙස් පිළිපැදීම

34. තවාන් දමා පැළ ලබා ගතහැකි බෝග වර්ග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) බෝංචි මිරිස්, වට්ටක්කා (2) මිරිස්, වම්බටු, තක්කාලි

(3) වැටකොළු, පතෝල, කව්පි

35. පොදු ස්ථානයක් නොවේ.

(1) රෝහල (2) මහා මාර්ගය (3) නිවස

36. අපේ රටේ රාජ්‍ය ආයතනයක් වන්නේ

(1) සෙලාන් බැංකුව (2) තැපැල් කාර්යාලය (3) සුපිරි වෙළඳසැළ

37. සතර බ්‍රහ්ම විහරණ යනු

(1) මෙත්තා, කරුණා, මුදිතා, ත්‍යාග (2) දාන, ශීල, භාවනා, වීරිය

(3) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා

38. රාජ්‍ය ලාංඡනයේ සෞභාග්‍ය හා පරිපූර්ණ බව පෙන්නුම් කරන්නේ

(1) පුන්කලසින් (2) වී කරලින් (3) ධර්ම චක්‍රයෙන්

39. ශ්‍රී ලංකාවේ ජාතික වෘක්ෂය වන්නේ

(1) බෝ (2) නා (3) නුග

40. දීපවාලී උත්සවය සමරනුයේ


(1) නොවැම්බර් (2) අප්‍රේල් (3) ජුලි

41. කාල නියමයක් නොමැතිව මල් පිපෙන ශාක වර්ග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) පොල් , කෙසෙල් , වතුසුදු (2) ඇහැළ, සල්, එරබදු

(3) බිනර, වෙසක්, මැයි, ඇහැළ

42. පහත බඳුන් දෙක දින දෙකකට පසුව නිරීක්ෂණය කළ විට දැකගත හැක්කේ කුමක් ද?




(1) පැහැදිලි ජලය යෙදූ පැළය මියගොස් තිබීම

(2) වර්ණ කළ ජලය ඇතුළත් පැළෑටිය මැළවී තිබීම

(3) වර්ණ කළ ජලය සහිත බඳුනේ පැළෑටිය සහ මල් වර්ණවත් වී තිබීම

43. මල්වල පැණි බීමට එන සතෙකි

(1) බත්කූරා (2) දිමියා (3) පැණිකුරුල්ලා

44. සතුන්ගෙන් ශාකවලට සිදුවන අයහපතකි

(1) පරාගනයට (2) බීජ ව්‍යාප්තියට (3) ශාක කා දැමීම

45. ආහාරපාන සඳහා ගන්නා මල් වර්ග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) බෙලි, රණවරා, කෙසෙල්, කතුරුමුරුංගා (2) බෙලි, රණවරා, හාතාවාරිය, ඉරමුසු

(3) ගොටුකොළ, වම්බටු, දඹල, කෙකටිය

46. පුස්තකාලයක දී සිදු කළයුතු නිවැරදි හැසිරීමකි.

(1) ශබ්ද නගමින් කතා කිරීම (2) පොත්වල පිටු ඉරීම

(3) නිශ්ශබ්දව අන් අයට බාධා නොවන සේ හැසිරීම

47. තමන්ගේ කටයුතු තමන් විසින් ම සිදුකර ගැනීමෙන් ලැබෙන දෙයක් නොවේ.

(1) දුකක් ඇතිවීම (2) අත්දැකීම් වැඩිවීම

(3) ජීවිතයට සාර්ථකව මුහුණදීමට හැකිවීම

48. ආහාරයට ගැනීමට සුදුසු දෙයකි.

(1) රස ගුණ පිරි කොළ වර්ග (2) පැණි බේරෙන රතු බුන්දි

(3) තෙල් බේරෙන බැදපු ආහාර


49. රටේ අනන්‍යතාවය පිළිබිඹු කරන ලක්ෂණයක් නොවේ

(1) ජාතික කොඩිය (2) ජාතික ගීය (3) ජාතික වීරවරයින්

50. ජාතික ගීය ගායනා කිරීමෙන් පසුව අවසානයේ දී කළ යුතු දෙයකි.

(1) සීරුවෙන් සිටීම (2) හිස නමා ආචාර කිරීම

iii. පහසුවෙන් සිටීම

51. 

රූපයේ දැක්වෙන ක්‍රීඩාව වන්නේ

(1) ක්‍රිකට්

(2) දැල්පන්දු

(3) වොලිබෝල්

52. හජ්ජි උත්සවය සමරන්නේ

(1)හින්දු (2) ඉස්ලාම් (3) බෞද්ධ

53. කැරොල් ගීත සන්දර්ශන පවත්වන්නේ

(1) කිතුනු (2) ඉස්ලාම් (3) බෞද්ධ

54. අපේ රට බ්‍රිතාන්‍යයන්ට යටත් වූයේ.

(1)1948 (2)1815 (3) 1796

55. 'රත්නදීප ජන්ම භූමි - ලංකාද්වීප විජය භූමි' යන ගීතය ගායනා කරන්නේ,

(1) පණ්ඩිත් ඉබ්ලිව්. ඩී. අමරදේව මහතා (2) රෝහණ වීරසිංහ මහතා

(3) සුනිල් ශාන්ත මහතා

56. ශාකයක වැඩිපුර ම මල් හටගන්නේ,

(1) කඳෙහි (2) හිරු එළිය හොඳින් ලැබෙන අතුවල

(3) සෙවණ සහිත අතුවල

57. සුබ පැතුම්පතක් නිර්මාණය කිරිමේ දී ඇලවීමට වඩාත් ම සුදුසු දෙයකි.

(1) $A_4$ කොළ (2) වියළාගත් මල් සහ ශාක පත්‍ර (3) සව් කඩදාසි

58. කුරුල්ලන් කූඩු සෑදීමට යොදාගන්නා දෙයක් නොවේ.

(1) මැටි (2) කෝටු කැලි (3) සිමෙන්ති

59. ගසක ගෙඩියක් බවට පත්වන කොටස වන්නේ

(1) කලංකය (2) මනිපත්‍ර (3) ඩිම්භකෝෂය

60. ඉක්මනින් මැල වී යන මලකි.

(1) වට්ටක්කා (2) සල් (3) මිරිස්

61. ගමනාගමනය සඳහා යොදාගන්නා වාහන හා වාහන පරිහරණයේ දී කටයුතු කළ යුතු ආකාරය හා මහමග දී හැසිරිය යුතු ආකාරය පිළිබඳව කියැවෙන ගීතයකි.

(1) මොනවද මුත්තේ මොකද කරන්නේ

(2) කියන්න සුළඟේ ඔබ කොයි සිටදෝ එන්නේ

(3) උදෑසනම පොඩි අපි දිව යනවා ( ලකුණු 1 x 30 )

62. '' මගේ රට ලස්සනයි '' යන මාතෘකාව යටතේ අර්ථවත් වැකි තුනක් ලියන්න. එක් වාක්‍යයක වචන හතරකට වඩා තිබිය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.

i. ........................................................................................................

........................................................................................................

ii. ........................................................................................................

........................................................................................................

iii. ........................................................................................................

........................................................................................................

(ලකුණු 06)

( පැහැදිලි අත් අකුරු සඳහා ලකුණු දෙකක් හිමි වේ)